# නිවුන් සහෝදරියෝ



වෙනුති දුල්දිනි කුමාරි දිසානායක

# නිවුන් සහෝදරියෝ

ඩී.එම්. වෙනුති දුල්දිනි කුමාරි දිසානායක

කතෘ

කතෘගේ වෙනත් කෘති

ළමා කතා මී කිරි හට්ටිය - 2024

ඉරුණු ගවුම - 2025

මහාමායා බාලිකා විද්‍යාලය මහනුවර
5 ශ්‍රේණිය D
පලමු මුද්‍රණය - 2026 ජූලි

ISBN – 978 – 624 – 211 – 337 – 1

# පිදුම

*ළා හිරු කිරණේ නැළවෙන*

*පුංචි කැකුළ මල වූ මා හට*

*මුතු පිණි වැස්සක සීතල අරගෙන*

*සුවය මිහිර නිති සදමින් සිත තුළ*

*සොම්නස රඳවන ආදර දෙගුරුණි,*

*මගේ ආදර ගුරු මවුනි දයාබර*

*ඔබටයි මාගේ මේ*

*ආදරණීය පුදදීම……*



# පෙරවදන

දිනෙන් දින සංකීර්ණ වන ගෝලීය අනාගත ලෝකයට දියණියන් සුදානම් කරණ බාලිකා අධ්‍යාපනයේ හැරවුම් ලක්ෂයක් ලෙස මහාමායා බාලිකා විද්‍යාලයේ මුලිකත්වයෙන් සිදුකරණ හේමමාලා උපහාර ගත්කරණ ව්‍යාපෘතිය නම්කළ හැකිය. දශකයක තරම් කාලයක් දහස් ගණනක් දැයේ දරුවන් ගත්කතුවරුන් ලෙස  දැයට දායාද කරන්නට හැකිවීම පාසලක් වශයෙන් ලබන විශිෂ්ට ජයග්‍රහණයකි.  මෙවරද වෙනත් පාසල් හා එක්ව පාසල් දරුවන්ට නව අත්දැකීම් සමුදායක් සන්නිවේදන නිපුණතා සාරධර්ම මෙන්ම නිර්මාණාත්මක ප්‍රවර්ධනය වැනි බහුවිධ කුසලතා සංවර්ධනය අරමුණු කොටගෙන පොත් ලියන්නට යොමුකරන ලදි. එහි ප්‍රතිඵලයක් ලෙස ලියැවී ඇති ළමා ග්‍රන්ථ තුළින් ලෝක බෞද්ධ ජනතාවගේ පුජනීය සංකේතය කන්ද උඩරටට අගයක් එකතු කළ ශ්‍රී දළදා වහන්සේ වැඩමකර වු හේමමාලා කුමරියට උපහාර දැක්වීම මෙවර අපගේ මුලික අරමුණයි.  මේ සදහා නිර්මානකරණයෙන් දායක වු පාසල් දරුවන් මගපෙන්වු ගුරුභවතුන් ඇතුලු සැමට ස්තුතිය පුදකරමු.

ශශිකලා සේනාධීර

විදුහල්පතිනිය

මහාමායා බාලිකා විද්‍යාලය

CamScanner

# සුභාශිංසන පණිවුඩය

මහනුවර මහාමාය බාලිකා විද්‍යාලය ආරම්භ කර ඇති හේමමාලා උපහාර ග්‍රන්ථකරණ ව්‍යාපෘතිය තුළින් නිර්මාණය වූ ග්‍රන්ථ එළි දැක්වීම වෙනුවෙන් මධ්‍යම පළාත් ගරු ආණ්ඩුකාරවර වශයෙන් සුභාශිංසන පණිවිඩයක් එක් කිරීමට ලැබීම මා ලැබූ භාග්‍යයක් කොට සළකමි.

අධ්‍යාපනය යනු සමාජයේ ප්‍රගතියට මූලික පදනම වන අතර, එය පොත්පත් හා සාහිත්‍ය නිර්මාණ හරහා තවදුරටත් ශක්තිමත් වේ. සිසු දරුවන්ගේ දක්ෂතා, නිර්මාණශීලීත්වය සහ බුද්ධිමය හැකියාවන් මෙවැනි ව්‍යාපෘති මඟින් මතුවීම ඉතා ප්‍රශංසනීය බව පැහැදිලිය.

මෙම ග්‍රන්ථකරණ ව්‍යාපෘතිය තුළින් සිසු දරුවන්ට පමණක් නොව, සමස්ත සමාජයටම වටිනා දැනුමක් සහ අගනා සාහිත්‍ය දායාදයක් ලබාදෙනු ඇති බව මම විශ්වාස කරමි. එමෙන්ම, මෙවැනි උත්සාහයන් තුළින් අනාගතයේ ශ්‍රී ලංකාවට අභිමානයක් වන ලේඛිකාවන් බිහිවනු ඇතැයි බලාපොරොත්තු වෙමි.

මෙම සාර්ථක කටයුත්ත සඳහා කැපවූ විදුහල්පතිතුමිය, ගුරු මණ්ඩලය, සිසු දරුවන් සහ සම්බන්ධ වූ සියලු දෙනාට මාගේ හෘදයාංගම ප්‍රශංසාව සහ ආශිර්වාදය පිරිනමමි. මෙම ව්‍යාපෘතිය සහ ග්‍රන්ථ එළි දැක්වීමේ උත්සවය විශිෂ්ට සාර්ථකත්වයක් ලබනු ඇතැයි ප්‍රාර්ථනා කරමි.


සරත් බී.එස්. අභයකෝන්,

ආණ්ඩුකාරවර,මධ්‍යම පළාත.

සම්මානිත මහාචාර්ය , පේරාදෙණිය විශ්වවිද්‍යාලය.


2026-05-10

# සුභාශිංසන පණිවුඩය

වත්මන් පාසල් පද්ධතිය තුළ දූ දරුවන් ග්‍රන්ථකරණයට යොමු කිරීමේ අරමුණින් මහනුවර මහාමායා බාලිකා විද්‍යාලයේ මූලිකත්වයෙන් මහනුවර කලාපයේ සෙසු පාසල්වල සහභාගිත්වයෙන් මෙවර පරම පූජනීය ශ්‍රී දළදා වහන්සේ ලක්දිවට වැඩමකළ හේමමාලා කුමරියට උපහාර පිණිස ග්‍රන්ථ එළි දැක්වීමේ ව්‍යාපෘතියක් සංවිධානය කළ මහනුවර මහාමායා බාලිකා විද්‍යාලයේ විදුහල්පති තුමිය ඇතුළු ආචාර්ය මණ්ඩලය, ශිෂ්‍ය දියණිවරුන්, සෙසු පාසල්වල ශිෂ්‍ය දූ පුතුන් සහ මෙම ව්‍යාපෘතිය සැලසුම්කර ක්‍රියාවට නැංවීමට කැපවූ සියලු දෙනාගේ විශිෂ්ට වූ උතුම් ප්‍රයත්නය අතිශයින් අගය කරමි.

ශ්‍රී ලංකාව දශක කිහිපයක් තිස්සේ සියලු දරුවන්ට නිදහස්, අනිවාර්ය, ගුණාත්මක හා සාධාරණ අධ්‍යාපනයක් ලබා දීමටත් එමඟින් අනාගතයේදී බුද්ධිමත් කුසලතා පූර්ණ පුරවැසි පරපුරක් බිහි කිරීමටත් කැපවී සිටී. එවන් පසුබිමක සුසමාහිත වූ සමබර පෞරුෂයක් සඳහා නිර්මාණ හැකියාව, විචාරශීලී චින්තනය ඇතුළු ධනාත්මක අංග ලක්ෂණ සංවර්ධනය වී අනාගත දැනුම් පාදක සමාජයක් නිර්මාණය කිරීමට පාසල් දරුවන්ගේ මෙම ග්‍රන්ථකරණ වැඩසටහන හේතු පාදක වේ. ශ්‍රී දළදා සමිඳු සරණින් හේමමාලා උපහාර ග්‍රන්ථකරණ ව්‍යාපෘතියේ සියලු කටයුතු සාර්ථක වේවායි මම ප්‍රාර්ථනා කරමි.

ප්‍රදීප් නිලංග දැල,
දියවඩන නිලමේ,
ශ්‍රී දළදා මාලිගාව
2026.05.10

# නිවුන් සහෝදරියෝ

එකමත් එක ගමක චෙතුනි සහ චනාරා කියලා පුංචි නිවුන් සහෝදරියෝ දෙදෙනෙක් හිටියා. පුංචි රෝස මල් දෙකක් වගේ මෙයාලා දෙන්නා රූපෙන් එක වගේමයි. අම්මයි තාත්තයි මෙයාලා දෙන්නට එක වගේ ම ඇඳුම් පැළඳුම් අන්දලා ආදරයෙන් බලා ගත්තා.



V

මෙයාලා දෙන්නගෙන් අක්කා තමයි චෙතුනි. නංගි චනාරා. ළඟින්ම ඉන්න අයටත් සමහර වේලාවට මේ දෙන්නව වෙන් වෙන්ව හොයා ගන්න බැරි වුනා.

චෙතුනි කියන්නේ හරිම ආදරණීය දරුවෙක්. එයා දෙමවුපියන්ට ගුරුවරුන්ට හරිම කීකරුයි. හොඳින් ඉගෙන ගන්නවා. ගේ දොර වැඩවලටත් අම්මාට තාත්තාට වගේම අත්තම්මාට ත් උදවු වෙනවා. යහළුවන් සමඟ සතුටින් සමඟියෙන් කටයුතු කරනවා.

ඒ වගේම එයා කාගෙවත්ම හිත රිදවන්නත් කැමති නැහැ. ලැබෙන දෙයින් සතුටු වෙන්න ත් එයාට ලැබෙන දේ බෙදා හදා ගෙන සතුටු වෙන්නත් චෙතුනි පුරුදු වෙලා හිටියා.

චෙතුනි වත්තට එන කුරුල්ලන්ට ලේනුන්ට කුරුලු ලැල්ලක් හදලා කෑම බීම දෙනවා. ගෙදර ඉන්න එයාලගේ පුංචි බලු පැටියාටත් ආදරෙන් සලකනවා. එයා සතුන්ට කිසිම හිංසාවක් කරන්නේ නෑ.

ඉතින් චෙතුනි හැමෝගෙම ආදරය දිනා ගත්ත හොඳ දරුවෙක් වුණා.



ඒත් චනාරාගේ හැසිරීම චෙතුනිට වඩා ටිකක් වෙනස්. එයා හැමදේම විහිළුවට ගන්නවා. වත්තට එන කුරුල්ලන්ට ලේනුන්ට වැලි, වතුර විසි කරනවා.

අම්මාට තාත්තාට උදවු වෙන්නෙත් ඒ තරම් කැමැත්තෙන් නෙවෙයි. බුදුන් වදිද්දිත් පිළිවෙලට ඉන්න චනාරාට හරිම අමාරුයි. චනාරා එයාට ලැබෙන දේ මදි කියලා නිතරම ඇඬුවා. ඉතිං චෙතුනි, නංගී අඬනවාට අකමැති නිසා එයාට ලැබුණු දේත් චනාරාට දෙනවා.




චනාරා යාළුවන්ටත් උසුළු විසුළු කරලා රිද්දුවා. ඒ නිසා යාළුවොත් චනාරාට ඒ තරම් කැමති වුණේ නෑ. චනාරාගේ මේ හැසිරීම ගැන චෙතුනිට දුකත් හිතුණා.

දවසක් චෙතුනියි චනාරායි වත්ත පහල ලොකු අඹ ගහ යට සෙල්ලම් ගෙයක් හැදුවා. මෙයාලා ඒ ගෙදර සෙල්ලම් බත් උයන්න ලෑස්ති වුණා.

හට්ටි මුට්ටිවලට පොල් කටුත්, ලොකු කොස් කොළ පිඟන්වලටත් ගත්තා. හැදිවලට ගත්තේ ලී පතුරු ටිකක්. කෙසෙල් මුවේ මල්, කොළ වර්ග, මල් වර්ග එළවළුවලට ගත්තා.

රතු පාට ගඩොල් කැටයක් කුඩු කරලා මිරිස් මෙයාලා හදා ගත්තා. ලුණු, තුන පහ, කහ කුඩුවලටත් මෙයාලා වත්තෙන්ම එක එක දේවල් හොයා ගත්තා.

අම්මා කුස්සියෙන් ඉවත් කරන පොල් රොඩු ටිකයි, තේ කොළ ටිකයි මෙයාලගේ ගෙදර පොල් සහ තේ කොළ වුණා. බත් උයන්න හාල් ටිකක් නම් අත්තම්මාගෙන් ඉල්ලා ගත්තා.




අත්තම්මා කැඩුණු හාල් ටිකක් තිබ්ලා මෙයාලට දෙන ගමන් හිනා වෙවී

" හුනුසාල් බත් හරිම රසයි. අද අපිට උණුවෙන්ම හුනුසාල් බත් කන්න පුළුවන් නේද එහෙනම් " කියලා කිවුවා.

ගල් තුන ගාණේ තියලා ලිපවල් හදා ගත්ත අක්ක නගෝ සෙල්ලම් බත් උයන්න පටන් ගත්තා.

දෙන්නා සෙල්ලම් කරද්දිත් චනාරා අක්කව තල්ලු කරනවා, අක්කගෙන් බඩු උදුරා ගන්නවා වගේ පුංචි පුංචි නරක වැඩත් කරනවා. චෙතුනිට ඒවට දුක හිතුණත් එයා, නංගි කරන ඒ වැඩ ගැන ඒ තරම් හිතන් නැතුව සෙල්ලම් කරනවා.

මේ දෙන්නා මෙහෙම ඉන්න තැනට එක පාරටම ලස්සන සුරංගනාවියක් ආවා. චෙතුනිටත් චනාරාටත් ඇස් අදහා ගන්න බැරි වුණා. එයාලා ටික වේලාවක් ඇස් පිල්ලමක්වත් නොගහා, ඉහළට ගත්ත හුස්මවත් පහල නොහෙළා ඒ ලස්සන සුරංගනාවී දිහාම බලන් හිටියා.



ඉතින් ඒ සුරංගනාවී හිනා වෙවී චෙතුනියි චනාරායි ළඟට ඇවිත්,

" ඇයි මේ ඔයාලා පුදුම වෙලා?. මම ආවේ ඔයාලව බලන්න " කියලා කිවුවා.

ඔන්න එතකොට තමා චෙතුනියි, චනාරායි හුස්ම පහළ හෙලුවේ. චනාරා එතකොටම සුරංගනාවිගෙන්

" ඔයත් ආවේ අපිත් එක්ක සෙල්ලම් කරන්නද? එහෙම නම් ඔයාට ඕනි සෙල්ලම් බඩු අරන් එන්න. මේවා නම් ඔයාට දෙන්න බෑ " කිවුවා.

මේ වෙනකම් නිශ්ශබ්දව හිටිය චෙතුනි,

" නෑ.. නෑ.. නංගී, අපි මෙයාවත් සෙල්ලම් කරන්න එක්ක ගමු " කිවුවා.

6

ඒත් චනාරා ඒ දේට කැමති වුණේ ම නෑ. ටික වෙලාවක් මෙයාලා දිහා බලන් හිටිය සුරංගනාවී චනාරා ළඟට ගිහින් චනාරාගේ ඔලුව අතගාන ගමන්

" මම ආවේ ඔයාලා එක්ක සෙල්ලම් කරන්න නෙවෙයි. පුංචි චනාරාට සුරංගනා ලෝකෙන් පණිවිඩයක් අරන් " කිවුවා.

" පුංචි චනාරා, ඔයත් අක්ක වගේ හොඳ දරුවෙක් වෙන්න. දෙමවුපියන්ට, ගුරුවරුන්ට කීකරු, හොඳින් ඉගෙන ගන්න දරුවෙක් වෙන්න. යහළුවන්ට, සතුන්ට හිරිහැර නොකරන ආදරණීය දරුවෙක් වෙන්න. ඔයා එහෙම හොඳ දරුවෙක් වුණාම ඔයාවත් අක්කවත් සුරංගනා ලෝකේ බලන්න එක්ක එනවා කියලා අපේ මවු සුරංගනාවී ඔයාට කියන්න කිවුවා."

පුදුම වෙලා සුරංගනාවියගේ කතාව අහන් හිටිය චනාරා, " ඔය ඇත්තමද ඔයා කියන්නේ? " කියලා ඇහුවා.

" ඔව්, මම ඇත්තමයි කියන්නේ. අපි ඔයාලා දිහා බලන් ඉන්නවා. ඔයා හොඳ දරුවෙක් වුණාම මම එනවා පොරොන්දුව ඉටු කරන්න" කියලා සුරංගනාවී නොපෙනී ගියා.

ටික කාලයක් යද්දී, චනාරාත්, චෙතුනි වගේම අම්මාට, තාත්තාට, ගුරුවරුන්ට කීකරු දරුවෙක් වුණා. යහළුවන් සමඟ සමඟියෙන් කටයුතු කළා. වත්තට එන සතුන්ටත් ආදරයෙන් සැළකුවා. ඉතිං පුංචි චනාරාටත් හැමෝම ආදරය කරන්න පටන් ගත්තා.

වෙතුනිට හරිම සතුටුයි. ඇය නංගී සමඟ සතුටින් පාඩම් කළා. සෙල්ලම් කළා.

සුරංගනාවියගෙග් කතාවත් වනාරාට නිතරම මතක් වුණා. හිතුවේවත් නැති දවසක ආයෙමත් මෙයාලා සෙල්ලම් කරමින් ඉන්න තැනට ලස්සන සුරංගනාවී ආවා.

වනාරාටත් වෙතුනිටත් හරිම සතුටුයි. එයාලා හිනාවෙලා දුවන් ගිහින් සුරංගනාවිය පිළිගත්තා. සුරංගනාවියටත් හරිම සතුටුයි.

“ මම මගේ පොරොන්දුව ඉටු කරන්නයි ආවේ පුංචි යාළුවනේ.“ කියලා සුරංගනාවී කිවුවා.

සුරංගනාවියගේ අත අල්ලගත්ත වනාරා,

“ මට සුරංගනා ලෝකෙට යන්න ඕනි නෑ.. මම දැන් දන්නවා හොඳ දරුවෝ ඉන්න හැමතැනම සුරංගනා ලෝකේ වගේ කියලා. අපි අනිත් අයට කරදර නොකර, අනිත් අයට ආදරයෙන් සැළකුවාම ලෝකෙම ලස්සන වෙනවා කියලා. ඒ වගේම අපිටත් ආදරය ලැබෙනවා කියලා මම දැන් දන්නවා. ඔයාට බොහොම ස්තූතියි“ කිවුවා.



“ ඔයා බොහොම හොඳ දරුවෙක් වෙලානේ. මට ඔයා ගැන හරිම සතුටුයි. ඔයාලා දෙන්නා හැමදාම මේ වගේ කීකරු හොඳ දරුවෝ වෙන්න. එතකොට ඔයාලට හැමදාම මෙහෙම සතුටින් ඉන්න පුළුවන්.“ කියලා සුරංගනාවී පුංචි නිවුන් සහෝරියන්ගේ අත් අල්ලා ගෙන සතුටින් කිවුවා.

සුරංගනාවී ආයෙත් මේ සහෝදරියන්ව බලන්න එන්න පොරොන්දු වෙලා නොපෙනී ගියා. පුංචි නිවුන් සහෝදරියන්, හැමදෙනාටම ආදරයෙන් කරුණාවෙන් සලකමින් බොහොම සතුටින් ජීවත් වුණා.



6



ඩී.එම්. වෙනුති දුල්දිනි කුමාරි දිසානායක

5 ශ්‍රේණිය D

මහාමායා බාලිකා විදුහල, මහනුවර

## පසුවදන

අධ්‍යාපන අමාත්‍යංශ අනුමැතියෙන් දශකයකට වැඩි කාලයක් පාසල් දරුවන් දහස් ගණනක් ගත්කතුවරුන් දැයට දායාද කළ මෙම ක්‍රියාමූලික පර්යේෂණ ව්‍යාපෘතිය පාසල් අධ්‍යාපනයේ ගුණාත්මක සංවර්ධනයට බෙහෙවින්ම උපකාරී වූ වැඩසටහනක් බව අධ්‍යාපනඥයින්ගේ පිළිගැනීමයි. නව අධ්‍යාපන ප්‍රතිසංස්කරණ වලට සමගාමීව මෙවර පාසල් දරුවන් පර්යේෂණ කෘතියක් රචනා කරන්නට යොමුකර වීම ව්‍යාපෘති ගමන්මගේ හැරවුම් ලක්ෂයකි. ඩිජිටල් තාක්ෂණික යුගයේ ස්මාර්ට් ඇල්ෆා පරම් පරාවකට අනාගත ලෝකය පෙන්වාදෙන නූතන පාසල නූතන තාක්ෂණික මෙවලම් මෙන්ම පොතපත ද සමව පරිහරණය කළයුතුබව පර්යේෂණාත්මකව පෙන්වා දෙන්නේ පොතකින් දරුවෙකුට ලැබෙන ආස්වාදය අන්කිසිවෙකින් වත් ලබාදිය නොහැකි නිසාය.

තවමත් අප අධ්‍යාපනයේ ප්‍රධාන මෙවලම මෙන්ම මානව දැනුම ගබඩා වී ඇති පොත පතින් දරුවන් දුරස් වීම වළක්වාගන්නට මෙන්ම අධ්‍යාපනයේ ගුණාත්මක සංවර්ධනය වෙනුවෙන් වසර ගණනාවක සිට මෙම ව්‍යාපෘතියට උරදී සිටින මහනුවර මහාමායා බාලිකා විද්‍යාලයේ මූලිකත්වයෙන් “හේමමාලා උපහාර” ග්‍රන්ථකරණ ව්‍යාපෘතිය දියත්වෙයි. පාසල් දරුවන් තුළ ශාස්ත්‍රීය හික්මීම මෙන්ම සාරධර්ම නිපුණතා ප්‍රවර්ධනයත් යුගයේ අවශ්‍යතාවයක් වන කාන්තාව සවිබළ ගැන්වීමට ඉතිහාසයේ යුගමෙහෙවරක් ඉටුකළ හේමමාලා කුමරියට උපහාර දැක්වීම ද මෙහි මූලික අරමුණයි.

මහනුවර මහාමායා බාලිකා විද්‍යාලයේ දියණියන්, විදුහල්පතිනිය, ගුරුභවතුන්, දෙමාපියන්, ආදි ශිෂ්‍යාවන් සහ සෙසු පාසල් නියෝජනය කරන සියලු දෙනාට ද, දියවඩන නිලම තුමන් ඇතුලු ශ්‍රී දළදා මාළිගාවේ කාර්ය මණ්ඩලයටද මෙම සද්කාර්ය වෙනුවෙන් ස්තූති වන්ත වෙමු.

සෙනෙවිරත්න මහලේකම්
(ව්‍යාපෘති නිර්මාතෘ)

**ISBN –** **978 – 624 – 211 – 337 – 1**